# 1.11 කෝල සන්නියෙහි ප්‍රාසංගික ලක්ෂණ

උපේක්ඛා ජීවනී ගංගොඩවිල
කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රී පාලි මණ්ඩපය.

## ABSTRACT

දහ අට සන්නිය වූ කලී සාමාන්‍ය ගැමියා වෙතින් බිහි වූ ගැමි නාට්‍යයක් ලෙස හැඳින්විය නොහැකිය. ඊට ප්‍රධානතම හේතුව වන්නේ එහි දැකිය හැකි දියුණු නාට්‍යමය ලක්ෂණ සහිත ප්‍රාසංගිකත්වයයි. දහ අට සන්නියෙහි මධ්‍යම සමයමෙන් පසුව ලිච්ඡවීන්ගේ පැමිණීමෙන් ආරම්භ වන ප්‍රධාන තේමාව ඔස්සේ ගොඩ නැගෙන සමස්ත නාට්‍යයක් දක්නට ලැබේ. එම ප්‍රධාන නාට්‍යයෙහි දැකිය හැකි කෙටි නාට්‍ය මාලාවකි. සමස්ත නාට්‍ය ඇතුළත තවත් කෙටි නාට්‍ය තිබීම පෙරදිග කථාන්තර කලා ව්‍යුහයේ දක්නට ලැබෙන ලක්ෂණයකි. එම ලක්ෂණය දහ අට සන්නියෙහි ආරම්භයේ සිටම දැකිය හැකිය.

දහ අට සන්නියෙහි දැකිය හැකි කෙටි නාට්‍ය මාලාවෙහි ප්‍රබල නාට්‍ය ලක්ෂණ සහිත කෙටි නාටකයක් ලෙස කෝල සන්නි යක්ෂයාගේ පැමිණීම හඳුන්වා දිය හැකිය. ක්‍රම ක්‍රමයෙන් ගැටුම්කාරී තත්ත්වය උත්සන්න වන මෙය ක්‍රියාදාමය, රංගනය, සංවාද, ගායනය හා වාදනය පදනම් කර ගනිමින් ප්‍රේක්ෂකයාට අපූරු වින්දනයක් ලබා දෙයි. මෙම අවස්ථාව දහ අට සන්නියෙහි දැකිය හැකි ප්‍රබල ප්‍රාසංගිකත්වයක් සමග අපූරු වින්දනයකින් යුතු නාට්‍යමය ලක්ෂණ සහිත අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය. කෝල සන්නියේ භාවිත නර්තනය පිළිබඳ විමසීමේදී ගමන් විලාසය අනුව නර්තනය යොදා ගැනීම, ගායනයේ යෙදෙමින් නර්තනයේ යෙදීම තාලානුකූල හා රිද්මයානුකූල චලන භාවිතය දැකිය හැකිය. එසේම එය ගීත නාටකයක ස්වරූපයක්ද උසුලයි. ඊට හේතුව වන්නේ කෝල සන්නි යක්ෂයා ඇදුරා සමග යෙදෙන සංවාදයෙහි අනතුරුව ඊළඟට ඔහු කිරීමට බලාපොරොත්තු වන දේ කවි ගායනයෙන් හා රංගනයෙන් ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමයි. මේ මොහොත වන විට අලුයම් සමයමේ අවසන් අදියරට පැමිණ ඇති අතර කෝල සන්නියට අවශ්‍ය පාරිසරික ස්වභාවයත් රඟ මඩලේ වන පසුතලයත්, රංග භාණ්ඩත් මන්දා ලෝකයත් යන කරුණු ඊට ලබා දෙන්නේ විචිත්‍රත්වය හා ගූඪත්වය මුසු අපූර්ව හැඟීමකි. එමගින් ඉන් අනතුරුව එළැඹෙන මොහොත පිළිබඳ කුතුහලය මුසු බියක් ආතුර හා ප්‍රේක්ෂක සිත්හි ජනිත වන අතර ඉහත කී සියලුම සාධකයන් සහිත මෙම නාටකීය අවස්ථාව ප්‍රාසංගිකත්වයේ වර්ධනීය අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකිය. ආහාර්ය අභිනයෙන් මනා විචිත්‍රත්වයක් දැකිය හැකි මෙම කෝල සන්නිය එහිදී භාවිත කරන වෙස් මුහුණත් හිසේ පිදෙන්නත්, ඉනේ පිදෙන්නත්, අනිකුත් චරිතයන්වල නොදැකිය හැකි ආකාරයේ සුවිශේෂ බවක් ගෙන එයි. සතර අභිනයෙන් යුක්ත මෙවැනි ප්‍රබල නාටකීය අවස්ථාවන් සංස්කෘත නාට්‍යයේ දක්නට ලැබේ.